3 වන වාර පරීක්ෂණය - 2009

සිංහල භාෂාව	කාලය පැය 2 යි

නම:..... ශ්‍රේණිය..... අංකය.....

- I පත්‍රයේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- I පත්‍රය සඳහා ලකුණු 40 කි.
- II පත්‍රයේ පිළිතුරු සඳහා ඔබ සපයාගත් කොළ භාවිතා කරන්න.
- ඒවා I පත්‍රය සමග එකට අමුණා භාර දෙන්න.

1 පත්‍රය

හිස්තැන් වලට ගැළපෙන අකුරු වරහනින් ගෙන ලියන්න.

1) පරිග____ කය සව____ (න, ණ)
2) වස____ සම්____න්ධ (බ, භ)
3) අනුරා____ ____ රක (ධා, දා)

ඉරි ඇඳි පදවල විරුද්ධාර්ථ පද හිස්තැන් වල ලියන්න.

4) <u>පෙරවරු</u> පාසැලට පැමිණි මම_____ ගෙදර ගියෙමි.
5) <u>නාගරික</u> ළමයි_____ ළමුන්ට වඩා දක්ෂය.
6) මිත්‍රයා <u>සැපතෙහි</u> මෙන්ම _____ ද එක සේ පවතියි.
7) <u>ආදායම්</u> යහපත් වීමට_____ පාලනය කර ගත යුතුය.
8) <u>ප්‍රවීණ</u> ලේඛකයෙක් ආදර්ශයට ගැනීම_____ අය කළ යුතුය.

දී ඇති අකුරු වලට අදාළ පිල්ලම් යොදා අර්ථවත් වචන දෙක බැගින් ලියන්න.

	ඇලපිල්ල		කෙටි ඇදපිල්ල	
9) ර -	_____	_____	_____	_____
10) ද -	_____	_____	_____	_____
11) ම -	_____	_____	_____	_____

සමානාර්ථ පදයක් හා විරුද්ධාර්ථ පදයක් බැගින් ලියන්න.

	සමානාර්ථ පදය	විරුද්ධාර්ථ පදය
12) පින් =	_____	_____
13) අලුත් =	_____	_____
14) සිනිඳු =	_____	_____

සුදුසු තැන්වල අදාළ විරාම ලකුණ යොදා ඒවා නම් කරන්න.

15) මොන කෑමද මේ වෙලාවේ _____
16) දීර්ඝායු වේවා _____

පහත සඳහන් ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නිව්ටන් ලෝකයේ කොතරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වුවද මොහුගේ ළමා කාලය එතරම් වාසනාවන්ත නොවීය. කුඩා නිව්ටන් ළමා වියේ සිටම චිත්‍ර ඇඳීමට සමතෙක් විය. ඔහු කායික වර්ධනයෙන් මෙන්ම බුද්ධිවර්ධනයෙන්ද ඉතා ඉක්මනින් වැඩුණේය. නිරතුරුවම ආලෝකය පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමේදී නානා වර්ණයෙන් යුත් ප්‍රතිබිම්බ දක්නට ලැබුණි.

17) මෙහි සඳහන් මහප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න.

_____ _____

18) සඤ්ඤක අක්ෂරයක් ලියන්න.

_____

19) මූර්ධජ අක්ෂර දෙකක් ලියන්න.

_____ _____

20) විරුද්ධාර්ථ පද ලියන්න.
වාසනාවන්ත - _____ ආලෝකය - _____

(ලකුණු 2 × 20=40)

II පත්‍රය

පළමු වන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

1) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වාක්‍ය රචනයක් ලියන්න. (වචන 100-150 අතර සෑහේ)

1. සැදෑ අසිරිය
2. පොදු දේපල සුරකිමු.
3. ජලය පණ මෙන් සුරකිමු.
4. මගේ මවු බිම
5. මා කැමති වීරයා

(ලකුණු 14 යි)

2) පහත සඳහන් ඡේදය ඇසුරු කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සිරිමල් පන්තියේ බිත්ති පුවත්පත සඳහා සකස් කර තිබුණ රචනය හා කවි නිර්මාණ දුටු සිංහල විෂය බාර ගුරුතුමිය එය මහත්සේ අගය කරමින් කතා කළාය. එය හොඳ පද ගැළපීමක් ඇති නිර්මාණශීලි ඉදිරිපත් කිරීමක් බව ප්‍රකාශ කළාය. පන්තියේ කවිරුත් ඒවා කියවිය යුතු බව කීවාය. බිත්ති පුවත්පත සඳහා නව අංග එකතු කිරීමට හැම දෙනාම උත්සහ කළයුතු බව පැවසුවාය.

1. බිත්ති පුවත්පතක පළ කළ හැකි නිර්මාණ දෙකක් නම් කරන්න.
2. ඒ මගින් සිසුන්ට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
3. සිරිමල්ගේ නිර්මාණ අගය කිරීමට හේතු දෙකක් සඳහන් කරන්න.
4. පන්තියේ බිත්ති පුවත්පත් මගින් ඔබ ලබා ගත් වාසි දෙකක් ලියන්න.

(ලකුණු 16 යි)

3) යුද්ධය තුරන් වීමෙන් පසුව අප රටේ තත්වය පැහැදිලි කරමින් විදේශගතව සිටින මිතුරෙකුට යවන ලිපියක් ලියන්න.

(ලකුණු 10 යි)

4) පහත ඇති පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා අකමැතිය හිරවී ඉඳිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන ඇසිලිලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මව්පිය කුරුල්ලන් ආහාර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටවා දකින අටින්
දුටුවා හිස්ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගියේ එළිවූ විට හතර වටින්

1. මෙම කවි වලින් කියැවෙන්නේ කා ගැනද? ඔහු අකමැති කුමටද?
2. මව්පිය කුරුල්ලන් ගෙනාවේ කුමක්ද?
3. ඔවුන් දුටුවේ කුමක්ද?
4. මෙම කාව්‍ය රචනය කාගේද?
5. "ආවා පුරුදු ලෙස පැටවා දකින අටින් " මෙහි අදහස ලියන්න.

(ලකුණු 10 යි)

5) "මේ ඇපල් ගෙඩිය බිමට ඇද වැටුණේ ඇයි? එය උඩට විසිවී යාමටත් ඉඩ තිබුණා නොවේද?" යනුවෙන් ඔහු කල්පනා කළේය.

1. "ඔහු" යනුවෙන් මෙහි සඳහන් වන්නේ කා ගැනද?
2. ඔහු සොයා ගත් නියමය කුමක්ද?
3. ඔහුගේ වෙනත් සොයා ගැනීමක් ලියන්න.
4. මෙම පුද්ගලයා උපන් රට නම් කරන්න.
5. ඔහු තොරතුරු සොයා ගත්තේ කුමන අංශයෙන්ද?

(ලකුණු 10 යි)

6) පහත සඳහන් ගීත බණ්ඩ හා පද්‍ය වල අඩු තැන් සම්පූර්ණ කරන්න.

1. එන්න දියේ බැස මා හා _____
_____ පළඳිමු අපි මාලා
2. කොවුලා බට ලී පිඹිනවා
_____
3. යමන් කළුවේ ගෙදර යන්න - කන්ද උඩින් අඳුර එනවා
_____ - _____

(ලකුණු 10 යි)

7) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

තණ කැවීම සඳහා එළදෙන ගෙන යන කොලුවාට, ඈ මහත් පරිශ්‍රමයෙකින් පය උස්සමින් සෙමෙන් කරන ගමන රුස්සන්නේ නැත. මේ දෙන් මැහැල්ල බලා ගන්නට වීම ගැන හෙතෙම කණගාටු වුයේය. ඇය දක්කාගෙන තණ කැවීමට ගෙනයන ඔහු දකින අනෙක් සේවකයන්ගේ සිනාසීමත් විහිළු-තහළුවත්ය, ඔහු නුරුස්සන්නේ. පාරේදී ඔහුට හඳ මුරුගේසු හෝ හඳයා හෝ කියමින් කොලුවෝ විහිළු කළහ.

1. මෙහි "ඈ" යනුවෙන් හඳුන්වන්නේ කාවද?
2. කොලුවාට රුස්සන්නේ නැත්තේ කුමක්ද?
3. මෙහි සඳහන් යුගල පදයක් ලියන්න.
4. ඔහු කණගාටු වන්නේ කුමක් සඳහාද?
5. සමාන පද ලියන්න.
   පරිශ්‍රමයෙකින් = _____
   පය = _____

(ලකුණු 10 යි)